# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ් ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1333/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 17/08/2024 පැය 0940

## මාධ්‍ය නිවේදනය

**ව්‍යාජ මුදල් නෝට්ටු සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රත්නපුර පොලිස් ස්ථානය.**

2024.08.16 වන දින දහවල් කාලයේ රත්නපුර පොලිස් වසමේ රත්නපුර නගරයේ ස්වර්ණාභරණ ආයතනයකට රන් භාණ්ඩ මිළදී ගැනීමට පැමිණි සැකකටයුතු පුද්ගලයෙකු පරීක්ෂා කිරිමේදී ඔහු සන්තකයේ තිබූ **ව්‍යාජ රුපියල් 5,000/- මුදල් නෝට්ටු 102 ක් හා පෙන්ඩ්‍රයිව් එකක් සමඟ සැකකරු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන සොරනාතොට, බදුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු ස්වර්ණාභරණ වෙළෙඳසැලට පැමිණ රන් මාලයක් මිළදී ගැනීමට අවශ්‍ය බව පවසා රුපියල් 5,000/- මුදල් නෝට්ටු මිටියක් මේසය මත තබා ඇති අතර එහි කළමණාකරු විසින් එම මුදල් නෝට්ටු ව්‍යාජ ඒවා බවට සැක සිතී පොලිසියට සිදු කරන ලද දැනුම් දීම මත සැකකරු පරීක්ෂා කර මෙසේ අත්අඩංගුවට ගෙන ඇත. පොලිසිය සිදු කල වැඩිදුර විමර්ශනයේදී සැකකරු විසින් මෙම ව්‍යාජ මුදල් නෝට්ටු නිවසේ ඇති මුද්‍රණ යන්ත්‍රයකින් මුද්‍රණය කර ඇති බවටද අනාවරණය වී ඇත. රත්නපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**